**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



# <u>ධීවර බෝට්ටු රක්ෂණය - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය</u>

**ඔප්පු වර්ගය** - ධීවර බෝට්ටු රක්ෂණය

**ලබා දෙනු ලබන ආවරණය**

මෙහි උපලේඛනයේ විස්තර කර ඇති බෝට්ටුවට (බඳ සහ/හෝ එන්ජිම යන දෙකටම) මුහුදේදී,වරායේදී හෝ නැව් තටාකවල තිබියදී (එන්ජිම සඳහා සපයා ඇති ආවරණය මුහුදේ දී පමණක් සීමා වේ) පහත සඳහන් කරුණු හේතුවෙන් සිදුවන පූර්ණ හානිය (සැබෑ හෝ නිර්මාණාත්මක) ආවරණය කරයි:

1. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හෝ එවැනි ඕනෑම රජයේ ආයතනයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද අයහපත් දැඩි කාලගුණික තත්ත්වයන්
2. කුණාටු
3. අකුණුසැර
4. අතරමංවීම්
5. සොරකම් (බලහත්කාරයෙන් සහ ප්‍රචණ්ඩත්වය යෙදීමෙන්)
6. සුනාමිය
7. ගින්න (ද්වේෂ සහගත ක්‍රියාවක ප්‍රතිඵලයකින් ඇතිවූ ගින්න හැර)
8. භූ කම්පන
9. පිපිරීම්
10. ගිනිකඳු පිපිරීම්
11. ඕනෑම ගොඩබිම් වාහනයක, තටායක, වරාය උපකරණයක, ස්ථාපනයක හෝ යාත්‍රාවක ගැටීමෙන්

ආවරණය කරන ලද බෝට්ටුව ධීවර කටයුතු සහ ඒ ආශ්‍රිත මෙහෙයුම් සඳහා හෝ උපලේඛනයේ විස්තර කර ඇති වෙනත් ඕනෑම අරමුණක් සඳහා භාවිතා කර තිබිය යුතුය, යන කොන්දේසියට යටත් වේ.

*(ආවරණ විෂය පථය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවේ 01 වෙනි පිටුව බලන්න)*

**<u>අමතර ආවරණ (අමතර වාරිකයක් ගෙවා ලබා ගත හැකිය):</u>**

1. වැඩවර්ජන කැරලි කෝලාහල සහ මහජන කැළඹීම් - *කරුණාකර පිටසන බලන්න - "යුද්ධය, වැඩවර්ජන, කැරලි කෝලාහල සහ සිවිල් කැලඹීම් පිටසන - 15"*

2. ත්‍රස්තවාදය - *කරුණාකර පිටසන බලන්න - "යුද්ධය, වැඩවර්ජන, කැරලි කෝලාහල සහ සිවිල් කැලඹීම් පිටසන - 15"*

3. ඇදගෙන යාමේ ගාස්තු

4. මගීන් සහ කාර්ය මණ්ඩලය සඳහා පුද්ගල හදිසි අනතුරු ආවරණය

**ප්‍රධාන ලක්ෂණය(යන්):**

ආවරණය වාර්ෂික පදනම මතය - ශ්‍රී ලංකාවේ භෞමික සීමාවන් තුල පමණි

**<u>වාරික ගෙවන ආකාරය:</u>**

වාර්ෂික වාරිකය රක්ෂණාවරණය ආරම්භයේදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ක්‍රමයක් සඳහන් කර තිබුණහොත් මිස) සහ ඉන් අනතුරුව කෙරෙන ඕනෑම අලුත් කිරීමකදී ගෙවිය යුතුය.

**<u>විධිවිධාන:</u>**

1. ඔප්පුව යටතේ ගෙවිය යුතු වන මුළු මුදල සම්පූර්ණ රක්ෂිත මුදල නොඉක්මවනු ඇත.
2. අමතර ආවරණ - ඔබේ ඔප්පු උපලේඛනයේ දක්වා ඇති පරිදි වේ.

**සාමාන්‍යය පිළිබඳ කොන්දේසිය**

මෙයින් එකඟත්වයෙන් ප්‍රකාශ කරනු ලබන්නේ, ඔප්පුව මගින් ආවරණය කර ඇති අලාභය හෝ හානිය සිදුවන අවස්ථාවේ දී රක්ෂිත බෝට්ටුවවෙහි (බෝට්ටුවල) වටිනාකම, රක්ෂිතයා විසින් ප්‍රකාශ කර ඇති වටිනාකමට වඩා වැඩි වුවහොත්, එහි වෙනස සඳහා රක්ෂිත පුද්ගලයා ඔහුගේම රක්ෂකයා ලෙස සලකනු ලබන අතර, ඒ අනුව අලාභයේ හෝ හානියෙහි ප්‍රමාණය රක්ෂිතයා විසින් දැරිය යුතු බවයි. බෝට්ටු එකකට වඩා වැඩි නම්, ඒවාද වෙන් වෙන් වශයෙන් මෙම කොන්දේසියට යටත් විය යුතුය. තවදුරටත් අවබෝධයෙන් එකඟවනු ලබන්නේ, බෝට්ටුවේ වෙළඳපල වටිනාකම යන්නෙන් අදහස් කරනුයේ ඒ හා සමාන වයසැති, සමාන නිෂ්පාදිත, සමාන මාදිලියේ සහ සමාන තත්ත්වයේ බෝට්ටුවක වටිනාකම වන බවයි.

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවේ 3 වන පිටුවෙහි "කොන්දේසි" කොටස බලන්න)*

**ආවරණය නොවන දේ (ව්‍යතිරේක)**

1. මෙම රක්ෂණය, යටත් කර ගැනීම්, අල්ලා ගැනීම්, අත්අඩංගුවට ගැනීම්, තහනම් කිරීම් හෝ රඳවාගැනීම් යනාදියෙහි ප්‍රතිඵලයක් වශයෙන් සහ එහි අනුශංගයක් වශයෙන් හෝ ඒ සඳහාවන යම් බියගැන්වීම් හේතුවෙන් සහ යුධ සටන් හෝ යුද්ධයක් බඳු මෙහෙයුම් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) යනාදියෙහි අනුශංගයක් වශයෙන් ඇතිවූ පූර්ණ හානි මෙම රක්ෂණය යටතේ බැහැර කරනු ලැබේ. එහෙත් මෙම කොන්දේසිය මගින් ඝට්ටනය, (පුපුරණ ද්‍රව්‍යයක් හෝ ටෝපිඩෝව හෙවත් දිය යට රඳවා ඇති නළ බෝම්බ හැර) වෙනත් යම් ස්ථිරව සවිකරන ලද හෝ පාවෙමින් තිබෙන්නාවූ වස්තුවක් සමග ගැටීම, ගොඩ ගැනීම, අයහපත් කාලගුණය හෝ (අදාල යාත්‍රාවෙහි ගමනෙහි හෝ සේවාවෙහි ස්වභාවයෙන් ස්වාධීනව හෝ ඝට්ටනයක් නම් එයට සම්බන්ධවූ අනෙකුත් යාත්‍රාව මගින් ඇතිවී තිබුණහොත් මිස) එදිරිවාදී ක්‍රියාවක් මගින් හෝ යුද්ධයෙහි යෙදී සිටින බලයක් මගින් සෘජුව ඇතිවූ ගින්න බැහැර නොකරයි. බලය යන යෙදුමට බලය යොදා ගනිමින් නාවික හමුදා හෝ ගුවන් හමුදා නඩත්තු කරන කුමන හෝ බලාධිකාරය අන්තර්ගත වන්නේය.

   තවද, සිවිල් කෝලාහල, විප්ලව, කැරළි කෝලහාල, හෝ එමගින් ඇතිවන සිවිල් විරෝධතා යනාදිය මගින් හෝ එහි අනුශංගයක් වශයෙන් ඇතිවන පූර්ණ හානි.

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



මෙම බැහැර කිරීම්වල විධිවිධාන හේතුවෙන් කිසියම් අලාභයක් හෝ හානියක් මෙම රක්ෂණයෙන් ආවරණය නොවන බවට සමාගම පවසා සිටින ඕනෑම ක්‍රියාමාර්ගයක්, නඩුවක් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් එවැනි අලාභයක් හෝ හානියක් ආවරණය වන බව ඔප්පු කිරීමේ වගකීම රක්ෂිතයා මත පැටවේ.

2. පහත සඳහන් දෑ වලින් ඇතිවන හෝ ඒවාට ආරෝපණය කරන ලද මුළු අලාභයද මෙම රක්ෂණය යටතේ අයකර ගත නොහැක.

   (i) ඉල්ලීම හෝ පූර්ව-භාරය: ඉල්ලීම මත හමුදා සේවයේ භාවිතා කරන බෝට්ටුව
   (ii) ද්වේශ සහගත ක්‍රියා
   (iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් අල්ලා ගැනීම් රඳවා තබා ගැනීම්, අත්අඩංගුවට ගැනම්, සීමා කිරීම්, හෝ රාජසන්තක කිරීම්
   (iv) නිරෝධායන රෙගුලාසි යටතේ හෝ කිසියම් රේගු රෙගුලාසි උල්ලංඝනය කිරීම් හේතුවෙන් අත්අඩංගුවට ගැනීම්, සීමා කිරීම් හෝ රඳවා තබා ගැනීම්
   (v) හෝ රජවරුන්, කුමාරිකාවන් හෝ ජනතාව බලහත්කාරයෙන් හෝ බලය පැහැර ගැනීමට උත්සාහ කරන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම් හේතුවෙන් රක්ෂිත ගමන හෝ චාරිකාව අහිමි වීම් හෝ කලකිරීම මත පදනම්ව.

3. සමාගම කිසිදු අනුශාංගික හානි සඳහා වගකිව යුතු නොවේ
4. මෙම රක්ෂණය බෝට්ටුව සඳහා වන වෙනත් රක්ෂණයක් යටතේ හෝ මෙම රක්ෂණයේ පැවැත්ම සඳහා එවැනි බෝට්ටු රක්ෂණයක් යටතේ අය කර ගත හැකි ඕනෑම මුදලක් සඳහා වන හිමිකම් පෑම බැහැර කරයි.
5. මෙම අයිතමයන් උපලේඛනයේ නිශ්චිතව විස්තර කර නොමැති නම්, ස්ථාවර උපකරණ සහ ධීවර ආම්පන්නවලට සිදුවන අලාභ හෝ හානි බැහැර කෙරේ
6. එන්ජිමේ හෝ බඳෙහි සැඟවුණු හෝ ආවේණික දෝෂයක් හේතුවෙන් සිදුවන අලාභ බැහැර කෙරේ
7. මුහුද මැදදී එන්ජිම ක්‍රියා විරහිත වීම හේතුවෙන් සිදුවන අලාභ බැහැර කෙරේ
8. ගලවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධ පිරිවැය බැහැර කෙරේ
9. ශ්‍රී ලංකාවේ භෞමික ජල සීමාවෙන් ඔබ්බට යාත්‍රාව ගසාගෙන යාම (මිනිසුන් සහිතව හෝ රහිතව) බැහැර කෙරේ
10. ඇදගෙන යාම හෝ ආපදාවකදී හැර ඇදගෙන යාමට භාජනය වීම
11. වලංගු බලපත්‍රයක් නොමැතිව ජාත්‍යන්තර මුහුදු තීරයේ සිදුවන අලාභ බැහැර කෙරේ
12. වෙනත් ඕනෑම යාත්‍රාවක් හෝ ස්ථාවර හෝ පාවෙන වස්තුවක් සමග ගැටීම හේතුවෙන් හැර, මුහුදේ ක්‍රියාත්මක වන අතරතුර පිටත එන්ජිම බඳෙන් විසන්ධි කිරීම බැහැර කෙරේ

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවේ 2-3 වන පිටුවල "ව්‍යතිරේක" කොටස බලන්න)*

**ප්‍රතිඥාභාර**

කිසියම් වගකීමක් සමග අනුකූල නොවීම, එය අවදානම වැඩි කළත් නැතත් ඕනෑම හිමිකම් පෑමකට බාධාවක් වනු ඇත.

- යාත්‍රාව මුහුදේ යාත්‍රා කිරීමට සුදුසු තත්ත්වයේ පවතින බවටත් මෙම සහතිකයේ කාලසීමාව පුරා එකී තත්වයේම අඛණ්ඩව පවතිනු ලබන බවටත් ප්‍රතිඥා දෙනු ලැබේ. තවදුරටත් ප්‍රතිඥා කරනු ලබන වග නම්, යාත්‍රාවේ කපිතාන්වරයා / නැව් පදවන්නා / නැව් පදවන්නන් සහ නාවික පිරිස මෙහි රක්ෂණය කර ඇති

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



සම්ප්‍රදායික නාවික ගමන් මාර්ගය / මෙහෙයුම් ප්‍රදේශය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සහ අත්දැකීම් ඇති පුද්ගලයන් විය යුතු බවත්, යාත්‍රාව මුහුණදෙන සාමාන්‍ය ආපදා අවස්ථාවන් වලට සාර්ථකව මුහුණදී යාත්‍රාව හැසිරවීමට / ගෙනයාමට / මෙහෙයවීමට හැකියාවක් ඇති අය විය යුතු බවටත්ය. තවද යාත්‍රාවේ ඉහතකී ආකාරයට හැසිරවීමට / ගෙනයාමට / මෙහෙයවීමට ප්‍රමාණවත් පිරිස් බලයක්ද තිබිය යුතුය.

- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හෝ එවැනි රජයේ ආයතනයක් විසින් දන්වා ඇති අයහපත් කාලගුණික තත්ත්වයන් පවතින අවස්ථාවන්වලදී යාත්‍රාව ගමනේ නොයෙදවිය යුතුය.

- මෙහි රක්ෂණය කර ඇති බෝට්ටු එන්ජින්, හබල් සහ රුවල් අලාභයෙන් හෝ හානියෙන් ආරක්ෂා වීමට සහ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගැනීමට රක්ෂිතයා සියලු සාධාරණ පූර්වාරක්ෂක පියවර ගත යුතුය.

- යාත්‍රාව / එන්ජිම අදාල දිනවලදී නිසිපරිදි නඩත්තු සේවා කටයුතුවලට යොමු කළ යුතු අතර එකී නඩත්තු සේවා පිළිබඳ වාර්තා සටහන් තබාගත යුතුය.

- යාත්‍රාවේ සෑම මොහොතකදීම ජලතරණ සහ සන්නිවේදන මෙවලම් සපයා තිබිය යුතුය.

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවේ 5 වන පිටුවෙහි "ප්‍රතිඥාහාර" කොටස බලන්න)*

**<u>හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි (අලාභයක් හෝ හානියක් සිදුවුවහොත් උපදෙස්)</u>**

රක්ෂණය කර ඇති පුද්ගලයා බෝට්ටුවේ සහ එහි යන්ත්‍රෝපකරණවල ආරක්ෂාව සඳහා සියලු සාධාරණ පූර්වාරක්ෂක පියවර ගත යුතු අතර මෙම ඔප්පුව යටතේ හිමිකම් පෑමට හේතුවන ඕනෑම සිදුවීමක් පිළිබඳ දැනගත් වහාම - අලාභයක් හෝ හානියක් සිදුවුවහොත් සමාගමට ලිඛිතව (හෝ 0112206306 ඔස්සේ සමාගමේ සම්බන්ධතා මධ්‍යස්ථානයට) වහාම දැනුම් දිය යුතුය. අලාභය සිදුවී පැය 24ක් ඇතුලත සමාගමට ඒ පිළිබඳව දැනුම්දීමක් නොකළහොත් සමාගම කිසිදු තත්ත්වයක් යටතේ කිසිදු සිදුවීමක් සම්බන්ධයෙන් වන්දි ලබා නොදේ.

සොරකමක් හෝ අලාභයක් සිදුවුවහොත් පොලීසියට දැනුම් දී ඕනෑම වැරදිකරුවෙකු සොයා ගැනීමට සහ දඬුවම් කිරීමට සහ දේපල සොයා ගැනීමට සහ ආපසු ලබා ගැනීමට සියලු සාධාරණ සහාය ලබා දිය යුතුය.

හිමිකම් පෑමක් සම්බන්ධයෙන් අවශ්‍ය වන මූලික ලියකියවිලි වන්නේ,

1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමය
2. ධීවර පරීක්ෂක වාර්තාව
3. පොලිස් වාර්තාවේ පිටපතක්
4. අළුත්වැඩියා ඇස්තමේන්තු හෝ හානියට පත් බඳ සහ/ හෝ එන්ජිම ප්‍රතිස්ථාපනය කිරීම සඳහා මිල ගණන්
5. සිද්ධිය විස්තර කරන බෝට්ටුවේ කපිතාන් වරයාගේ ලිඛිත ප්‍රකාශය
6. බෝට්ටු ලියාපදිංචි කිරීමේ පොතේ පිටපතක්

7. සමීක්ෂණ ප්‍රකාශයේ පිටපතක්
8. බෝට්ටු පිටත් වීමේ පෝරමයේ පිටපතක්
9. හිමිකම් පෑම සැකසීමට අවශ්‍ය තොරතුරු මත පදනම්ව අපහට අමතර ලියකියවිලි / විස්තර අවශ්‍ය විය හැකිය.

*කරුණාකර ඔප්පුවේ 06 සහ 07 වන පිටුවල "අලාභයක් හෝ හානියක් සිදුවුවහොත් උපදෙස්" කොටස යටතේ කරුණු අංක 9 බලන්න*

**<u>වංචාව:</u>**

හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් වංචනික නම් හෝ මෙම ඔප්පුව යටතේ කිසියම් ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා ඔබ හෝ ඔබ වෙනුවෙන් ක්‍රියා කරන ඕනෑම අයෙකු විසින් කිසියම් වංචනික ක්‍රමයක් හෝ උපකරණයක් භාවිතා කර ඇත් නම්, හෝ ඔබ සිතාමතා කරන ලද ක්‍රියාවක් නිසා හෝ ඔබගේ අනුදැනුම ඇතිව සිදු කරන ලද කිසියම් අලාභයක්, විනාශයක්, හානියක්, නීතිමය වගකීමක් හෝ වියදමක් සිදුවුවහොත්, මෙම ඔප්පුව යටතේ සියලුම ප්‍රතිලාභ අහිමි වනු ඇත.

*වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවේ 04 වන පිටුවෙහි "කොන්දේසි" කොටස බලන්න*

**<u>ඔප්පු හිමියාගේ වගකීම්:</u>**

**වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම**

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වළක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.

- ඔප්පු කාලසීමාවේදී:- අවදානම් හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගමට දැනුම් දෙන්න.

**හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම**

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.
- වාරික ගෙවීම:- ඔප්පුවේ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයට අනුව විය යුතුය.

*කරුණාකර ඔප්පුවේ 04 වන පිටුවෙහි "කොන්දේසි" කොටස යටතේ කරුණු අංක 9 බලන්න*

**<u>පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:</u>**

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටිමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය:

- දුරකථනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011- 2126136
- ඊ-මේල් හරහා - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් හරහා - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109

- තැපැලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය හරහා - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න
- අප කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු
iii. යොමුව: ඔප්පු අංකය / වාහන අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න.

**ආරවුල් විසඳීම:-**

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් (ADR) භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
නො 01, බෙතෙස්ඩා පෙදෙස,
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*කරුණාකර ඔප්පුවේ 5 වන පිටුවෙහි "හිමිකම් ක්‍රියාපටිපාටි" කොටස බලන්න*

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

**<u>මතක තබා ගත යුතු කරුණු කිහිපයක්</u>**

**අවලංගු කිරීම පිළිබඳ වගන්තිය:**

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කළ හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණය අවලංගු කළ හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත් නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටී.

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවේ 4 වන පිටුවෙහි "කොන්දේසි" කොටස බලන්න)*

- මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිළිපැදීම සහ ඉටු කිරීම, මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ රක්ෂණ සමාගමෙහි වගකීමට පූර්ව කොන්දේසියක් වනු ඇත.
- රක්ෂිතයා විසින් රක්ෂිතයා සතු දේපලට සිදුවන අලාභය හෝ හානිය වැළැක්වීමට හෝ අවම කිරීමට සියලු සාධාරණ පූර්වාරක්ෂක පියවර ගත යුතුය.
- හිමිකම් පෑමකදී නිවැරදි වන්දි මුදල ලබා ගැනීම සඳහා රක්ෂිතයා විසින් දේපල එහි වර්තමාන වෙළඳපල වටිනාකමට රක්ෂණය කර ඇති බවට සහතික විය යුතුය.

**වැදගත් සටහන්:**

රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාළ වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්ෂණයට අදාළ ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්ෂණ ඔප්පුවේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

**වැඩිදුර තොරතුරු සඳහා:**

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකථනය - 011-2126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයන් වෙත පැමිණීමෙන්